# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1864/39 - 2014 මැයි මස 28 වැනි බදාදා - 2014.05.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වැනි අධිකාරිය)**

**ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන පුද්ගලයන්ට ශ්‍රී ලංකාවේ සංස්ථාගත සමාගම්වල ණයකර නිකුත් කිරීම හා පැවරීම සඳහා අවසරය ලබාදීම**

ශ්‍රී ලංකාවේ සංස්ථාගත සමාගමක ශ්‍රී ලංකා රුපියල් වලින් නියම කර ඇති ණයකර, දේශීය අරමුදල්, ප්‍රාදේශීය අරමුදල් හෝ අන්‍යොන්‍ය අරමුදල් ඇතුළු විදේශීය ආයතනික ආයෝජකයන්ට, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත සංස්ථාවලට, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් වන විදේශීය රාජ්‍යවල පුරවැසියන්ට සහ ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලාංකිකයන්ට (මින් මතුවට " සුදුසුකම්ලත් ආයෝජකයන්" ලෙස නම් කෙරේ) නිකුත් කිරීම සහ පැවරීම සඳහා විනිමය පාලන පනතේ 10, 11, 15 සහ 30 වැනි වගන්තියේ 5 වැනි උප වගන්තිය යන වගන්ති ප්‍රකාරව පහත නියමයන් හා කොන්දේසිවලට යටත්ව මෙමගින් අවසර ප්‍රදානය කරනු ලැබේ.

1. **ණය කර සඳහා අදාල වන නියමයන් සහ කොන්දේසි :**

1.1 මෙම දැන්වීම යටතේ නිකුත් කරනු ලබන සියළුම ණයකර කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කළ හෝ ලැයිස්තුගත නොකළ ඒවා විය හැකිය ;

1.2 ණයකරය නිකුත් කළ දිනයේ සිට වසරක් ඉකුත් වූ පසු පමණක් ප්‍රාග්ධන නිදහස් කිරීම ආරම්භ කළයුතු අතර, ණයකරයේ කල් පිරීමේ අනුපාතිකව ණයකරය සඳහා වන ප්‍රාග්ධන ගෙවීම් සිදු කළ යුතුය ;

1.3 පරිවර්ත්‍ය ණයකරයක් වන අවස්ථාවකදී, සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීම 2002 අප්‍රේල් 19 දිනැති අංක 1232/14 දරන (සංශෝධිත) *රජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනයෙහි නියම කර ඇති බැහැර කිරීම් සහ සීමා කිරීම්වලට යටත්ව සිදු කළ යුතුය.

2. **ණයකර නිකුත් කරන සමාගමට අදාළ වන නියමයන් සහ කොන්දේසි :**

2.1 සුදුසුකම් ලත් ආයෝජකයකු විසින් ණයකරවල සිදු කරන ආයෝජනයන් සහ ණයකරවලට අදාල ගෙවීම් සිදු කළ හැක්කේ විනිමය පාලක විසින් බලයලත් වෙළෙඳුන්ට දෙන ලද විධානයන්ට අනුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවක විවෘත කර පවත්වාගෙන යනු ලබන, එම ආයෝජකයාගේ සුරැකුම්පත් ආයෝජන ගිණුමක බැරට පවතින මුදල් වලින් පමණි.


1A - G 19632 — 20 (2014/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2.2 මේ යටතේ අවසර දෙනු ලැබූ ඕනෑම ගණුදෙනුවක් සම්බන්ධයෙන් අදාළ ප්‍රාග්ධනය, පොලී සහ කොමිස් ගෙවීම සම්බන්ධයෙන් වගකීම දරන්නා වූ බලයලත් වෙළෙන්දෙක් හෝ වෙනත් ඕනෑම තැනැත්තෙකු විසින් ඉහත 2.1 ඡේදයෙහි සඳහන් සුරැකුම්පත් ආයෝජන ගිණුමට හෝ එම ගිණුමෙන් පමණක් එම ගෙවීම් සිදු කළ යුතුය.

2.3 ණයකර නිකුත් කරන සමාගම විසින් පහත සඳහන් විස්තර අඩංගු වාර්තාවක් ණයකරවල ආයෝජනය සඳහා ප්‍රේෂණ ලැබී දින 30 ක් ඇතුලත විනිමය පාලක වෙත එවිය යුතුය :-

(අ) සුරැකුම්පත් ආයෝජන ගිණුම් හරහා ලද මුළු වටිනාකම,
(ආ) අදාළ ප්‍රේෂණ ලද බලයලත් වෙළෙඳුන්ගේ නම් සහ ලිපිනයන්,
(ඇ) අදාළ ණයකරවල කල් පිරීමේ ව්‍යුහය.

3. මේ යටතේ අවසර දෙනු ලැබූ ගනුදෙනු සම්බන්ධයෙන් සුදුසුකම්ලත් ආයෝජකයා විසින් විවෘත කර පවත්වාගෙන යනු ලබන සුරැකුම්පත් ආයෝජන ගිණුමක බැරට සිදු කරන ගෙවීම් සඳහා මෙම අවසරය යටතේ ණයකර නිකුත් කරන සමාගමකට විනිමය පාලන පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර ප්‍රදානය කෙරේ.

4. මේ යටතේ අවසර දෙනු ලැබූ ගනුදෙනු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන පුද්ගලයෙකුට ණයකර සහතික අපනයනය කිරීම සඳහා (අදාළ නම්) මෙම අවසරය යටතේ ණයකර නිකුත් කරන සමාගමකට විනිමය පාලන පනතේ 22 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර ප්‍රදානය කෙරේ.

5. (අ) 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇතිකරගත් ගිවිසුමක් මගින් විනිමය පාලන පනතේ ප්‍රතිපාදන අදාල වීමෙන් නිදහස් කරන ලද ව්‍යවසායක්,

(ආ) වෙනත් නීතියක විධිවිධාන කෙරෙහි ද,

මෙම දැන්වීමෙහි ඇතුළත් කිසිවකින් යම් බලපෑමක් හෝ සම්බන්ධයක් ඇත්තේ යැයි වටහා නොගත යුතුය.

6. මෙම දැන්වීමෙහි කාර්යය සඳහා "බලයලත් වෙළෙන්දා" යන්නෙන් විනිමය පාලන පනතේ දී ඇති අර්ථයම අදාල වනු ඇත.

7. විනිමය පාලන පනතේ 10, 11, 15 සහ 30 වැනි වගන්තියේ 5 වැනි උප වගන්තිය යන වගන්ති ප්‍රකාරව 2010.11.22 දිනැති *අති විශේෂ ගැසට් පත්‍ර* අංක 1681/11 සහ 2011.11.22 දිනැති *අති විශේෂ ගැසට් පත්‍ර* අංක 1733/19 හි පළ කරන ලද දැන්වීම මෙමඟින් අවලංගු කරනු ලැබේ.

පී. එච්. ඕ. චන්ද්‍රවංශ,
විනිමය පාලක.

වර්ෂ 2014 ක් වූ මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

06 - 343

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.